ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

**පුවත්පත් නිවේදනය**

<u>ඉන්දීය උප ජනාධිපතිතුමාගේ ශ්‍රී ලංකා සංචාරය **(2026 අප්‍රේල් 19-20)**</u>

ඉන්දීය උප ජනාධිපති ගරු ශ්‍රී සී. පී. රාධාක්‍රිෂ්ණන් මැතිතුමා 2026 අප්‍රේල් 19-20 දිනවල ශ්‍රී ලංකා සංචාරයක නිරත විය. ධීවර, පශු සම්පත් සහ කිරි ආශ්‍රිත නිෂ්පාදන රාජ්‍ය අමාත්‍ය සහ පංචායති රාජ් රාජ්‍ය අමාත්‍ය මහාචාර්ය එස්. පී. සිං බගේල්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වන ආචාර්ය කේ. ලක්ෂ්මන් මැතිතුමා සහ ආචාර්ය මේධා විශ්‍රම් කුල්කර්නි මැතිනිය ද එතුමා සමඟ මෙම සංචාරයට එක් වූහ. මෙය ඉන්දීය උප ජනාධිපතිවරයකු විසින් සිදු කළ ප්‍රථම ද්විපාර්ශ්වික සංචාරය විය. මෙයට පෙර 2000 වසරේ ඔක්තෝබර් මාසයේදී ඉන්දීය උප ජනාධිපති ශ්‍රී ක්‍රිෂාන් කාන්ත් මැතිතුමා හිටපු ශ්‍රී ලංකා අග්‍රාමාත්‍ය සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ රාජ්‍ය අවමංගල්‍ය උත්සවය සඳහා සහභාගී විය.

2. අප්‍රේල් 19 වන දින ගරු උප ජනාධිපතිතුමා කොළඹ, ජනාධිපති ලේකම් කාර්යාලයේදී අතිගරු අනුර කුමාර දිසානායක මැතිතුමා හමු විය. නායකයන් දෙපළ ඉන්දියාව විසින් ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක කරනු ලබන සංවර්ධන සහයෝගිතා ව්‍යාපෘතීන්වල ප්‍රගතිය ඇතුළු දැනට ක්‍රියාත්මක ද්විපාර්ශ්වික මුලපිරීම් සමාලෝචනය කළහ. 2025 නොවැම්බර්-දෙසැම්බර් ශ්‍රී ලංකාව මුහුණ දුන් දිට්වා සුළි කුණාටුවෙන් දැඩි ලෙස විනාශ වූ උතුරු දුම්රිය මාර්ගයේ දුම්රිය ගමනාගමන කටයුතු නැවතත් ආරම්භ කර ඇති බව නායකයන් දෙපළ සතුටින් සිහිපත් කළහ. ඉන්දීය රජය විසින් ලබා දෙන ලද ඇමරිකානු ඩොලර් මිලියන 5ක ප්‍රදානයක් යටතේ මෙම දුම්රිය මාර්ගය ප්‍රතිසංස්කරණය කරන ලදී. දිට්වා සුළි කුණාටුව විසින් සිදු කරන ලද මහත් විනාශයෙන් අනතුරුව අත්‍යවශ්‍ය මාර්ග සම්බන්ධතා ප්‍රතිෂ්ඨාපනය කරමින් ඉදි කරන ලද තවත් බේලි පාලම් තුනක ඉදිකිරීම් කටයුතු සම්පූර්ණ කිරීම සම්බන්ධයෙන් ඉන්දීය උප ජනාධිපතිතුමා සහ ශ්‍රී ලංකා ජනාධිපතිතුමා සතුට පළ කළහ. මෙම බේලි පාලම් දිට්වා සුළි කුණාටුවෙන් අනතුරුව ඉන්දියාව විසින් ශ්‍රී ලංකාවේ නැවත ඉදි කිරීමේ සහ පුනරුත්ථාපන කටයුතු සඳහා ලබා දෙන ලද ඇමරිකානු ඩොලර් මිලියන 450ක ආධාර පැකේජය යටතේ ඉදි කරන ලදී. ඉන්දියාව ප්‍රමුඛ 'බිග් කැට් එලායන්ස්' (Big Cat Alliance) සංවිධානයට එකතු වීමට ශ්‍රී ලංකාව ගත් තීරණය සම්බන්ධයෙන් ද උප ජනාධිපතිතුමා සිය සතුට පළ කළේය.

3. ශ්‍රී ලංකා අග්‍රාමාත්‍ය ගරු ආචාර්ය හරිනි අමරසූරිය මැතිනිය විසින් ගරු උප ජනාධිපතිතුමා හට දිවා භෝජන සංග්‍රහයක් පිරිනමන ලදී. අග්‍රාමාත්‍යතුමිය සහ උප ජනාධිපතිතුමා ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර ගැඹුරු ශිෂ්ටාචාරමය බැඳීම් සහ එම බැඳීම් ජීවමානව පවත්වා ගැනීමට ඉවහල් වන විචිත්‍රවත් ජනතා සබඳතා පිළිබඳව සාකච්ඡා කළහ. ගරු උප ජනාධිපතිතුමා සහ ශ්‍රී ලංකාවේ අධ්‍යාපන අමාත්‍යතුමිය ද වන අග්‍රාමාත්‍ය හරිනි අමරසූරිය මැතිනිය ලංකා වතු කම්කරු අධ්‍යාපන භාරය (CEWET) යටතේ ක්‍රියාත්මක ශිෂ්‍යත්ව යෝජනා ක්‍රමය ඉහළ නංවා ඇති බව ද සතුටින් සිහිපත් කළහ. මේ අනුව වතු කම්කරුවන්ගේ දරුවන් උදෙසා පිරිනමනු ලබන ශිෂ්‍යත්ව ප්‍රමාණය 350 සිට 700

දක්වා ද මාසික දීමනාව උසස් පෙළ සිසුන් සඳහා රුපියල් 2500 සහ උසස් අධ්‍යාපනය හදාරන සිසුන් සඳහා රුපියල් 7500 දක්වා ද ඉහළ නංවා ඇත.

4. ගරු උප ජනාධිපතිතුමා අප්‍රේල් 19 වන දින විපක්ෂ නායක සජිත් ප්‍රේමදස මැතිතුමා මෙන්ම ඉන්දීය සම්භවයක් සහිත දමෙළ නායකයන් සහ ශ්‍රී ලංකා දමෙළ නායකයන් ද හමු විය.

5. උප ජනාධිපතිතුමා කොළඹ, නව කදිරේසන් ශාලාවේ පැවති ප්‍රජා ප්‍රිය සම්භාෂණයක දී ඉන්දීය ඩයස්පෝරා සාමාජිකයන් 1000ක් පමණ ඇමතීය. එහිදී එතුමා OCI කාඩ් පහසුකම ශ්‍රී ලංකාවේ ඉන්දීය සම්භවයක් සහිත දමෙළ ප්‍රජාවේ 5 වන සහ 6 වන පරම්පරාවන් ද ඇතුළත් වන පරිදි පුළුල් කෙරෙන බව නිවේදනය කළේය. මේ දක්වා OCI කාඩ් ලබා ගත හැකි වූයේ ඉන්දීය සම්භවයක් සහිත දමෙළ ප්‍රජාවේ සිව් වන පරපුර දක්වා වන සාමාජිකයන්ට පමණි. OCI කාඩ් ලබා ගැනීමේ ක්‍රියාවලිය සරල කෙරෙන බව ද උප ජනාධිපතිතුමා නිවේදනය කළ අතර ඒ අනුව ශ්‍රී ලංකා රජය විසින් උපත පිළිබඳ නිකුත් කරන ලද සහතික ද පිළිගැනෙනු ඇත. දැන් ශ්‍රී ලංකා රජය විසින් නිකුත් කරන ලද ලියාපදිංචි කිරීමේ සහතික, ඉන්දියානු සහ ශ්‍රී ලංකා ගුවන් ගමන් බලපත්‍ර හෝ කොළඹ, ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය සහ මහනුවර සහකාර මහ කොමසාරිස් කාර්යාලය විසින් පවත්වාගෙන යනු ලබන ලියාපදිංචි කිරීම් සහතික ඇතුළු සහතික පදනම් කරගෙන OCI කාඩ් නිකුත් කෙරෙනු ඇත. මෙය ශ්‍රී ලංකාවේ ඉන්දීය ඩයස්පෝරාව විසින් දිගු කලක් තිස්සේ කරන ලද ඉල්ලීමක් වන අතර විශේෂයෙන්ම වතු කම්කරුවන් ඇතුළු ඉන්දීය සම්භවයක් සහිත දමෙළ ප්‍රජාවට ප්‍රතිලාභ ගෙන දෙනු ඇත. ගරු උප ජනාධිපතිතුමා ඉන්දීය නිවාස ව්‍යාපෘතියේ තෙවන අදියර සම්පූර්ණ කිරීම සනිටුහන් කරමින් ඒ යටතේ ඉදි කරන ලද අවසාන නිවාස 145 අතථ්‍ය අයුරින් ප්‍රතිලාභී අයිතියට පත් කළේය. මෙම අදියර යටතේ වතු කම්කරුවන් සඳහා නිවාස 4000ක් ඉදි කරන ලදී. ඉන්දියානු රුපියල් කෝටි 1835ක පමණ (ශ්‍රී ලංකා රුපියල් බිලියන 62.75ක පමණ) පිරිවැයකින් ක්‍රියාත්මක ඉන්දීය නිවාස ව්‍යාපෘතිය ප්‍රමුඛතම ඉන්දීය ප්‍රදාන ව්‍යාපෘතියක් වන අතර එය ඉන්දියානු රජය විසින් විදේශ රටක ක්‍රියාත්මක කරනු ලබන විශාලතම ව්‍යාපෘතිය වේ. මෙම ව්‍යාපෘතිය යටතේ දැනටමත් නිවාස 50,000ක් ඉදි කර ඇති අතර තවත් නිවාස 10,000ක් ඉදි වෙමින් පවතී.

6. උප ජනාධිපතිතුමා කදිරේසන් කෝවිල සහ 2026 පෙබරවාරි මාසයේදී ගුජරාටයේ දේව්නි මෝරි සර්වඥ ධාතුන් වහන්සේලා ප්‍රදර්ශනය කළ ගංගාරාම විහාරස්ථානය ද වැඳ පුදා ගත්තේය.

7. අප්‍රේල් 20 වන දින, ගරු උප ජනාධිපතිතුමා ඉන්දියානු නිවාස ව්‍යාපෘතිය යටතේ නුවරඑළිය, රාගල ලිඩ්ල්ස්ඩේල් වතුයායේ ඉදි කරන ලද නිවාස නැරඹීමට එක් විය. එහිදී එතුමා ප්‍රතිලාභී පවුල් සමඟ පිළිසඳරක නිරත වූ අතර ඉන්දියානු නිවාස ව්‍යාපෘතියේ තෙවන අදියර යටතේ නිවාස 166ක් ඉදි කරන ලද ගම්මානයේ සංචාරයක නිරත විය.

8. නුවරඑළිය සංචාරයේදී, ගරු උප ජනාධිපතිතුමා සීතා අම්මාන් කෝවිල ද වැඳ පුදා ගත්තේය. රාමායණය හා සම්බන්ධ මෙය රාවණා රජු විසින් අශෝක උද්‍යානය තුළ සීතා දේවිය රඳවා සිටි ස්ථානය ලෙස සැලකේ.

9. OCI කාඩ් පහසුකම පුළුල් කිරීම, ඉන්දියානු නිවාස ව්‍යාපෘතියේ තෙවන අදියර සම්පූර්ණ කිරීම, ප්‍රතිසංස්කරණය කරන ලද උතුරු දුම්රිය මාර්ගයේ දුම්රිය ගමන් ආරම්භ කිරීම, බෝලි පාලම්

තුනක් ස්ථාපනය කිරීම, CEWET ශිෂ්‍යත්ව යෝජනා ක්‍රමය පුළුල් කිරීම සහ ශ්‍රී ලංකාව ජාත්‍යන්තර බිග් කැට් එලායන්ස් සංවිධානය හා එක් වීමට තීරණය කිරීම යන නිවේදනයන්ට අමතරව පහත සඳහන් අවබෝධතා ගිවිසුම් ද දෙපාර්ශ්වය විසින් හුවමාරු කර ගන්නා ලදී.

i. නැගෙනහිර පළාත සඳහා වන බහු ආංශික ප්‍රදාන සහයෝගය යටතේ පළමු ප්‍රමුඛතා ව්‍යාපෘතීන් 6 සම්බන්ධයෙන් වන අවබෝධතා ගිවිසුම

ii. මුලතිව් දිසා මහා රෝහල සඳහා සිව් මහල් වෛද්‍ය වාට්ටු සංකීර්ණයක් ඉදි කිරීම සඳහා වන අවබෝධතා ගිවිසුම

10. ශ්‍රී ලංකාව ඉන්දියාවේ මහාසාගර් (MAHASAGAR) දැක්ම සහ අසල්වැසියා ප්‍රථමයෙන් යන ප්‍රතිපත්තිය තුළ ඉතා වැදගත් සහකරුවකු වේ. ගරු උප ජනාධිපතිතුමාගේ ශ්‍රී ලංකා සංචාරය මෑත කාලීනව දෙරට අතර සිදු වූ ඉහළ මට්ටමේ නියැලීම්වලින් අනතුරුව සිදු වන අතර එය ඉන්දියාව සහ ශ්‍රී ලංකාව සම්බන්ධ කරන සියවස් ගණනාවක ඉපැරණි ජනතා සබඳතා තවදුරටත් ශක්තිමත් කරනු ඇත.

****

**කොළඹ**
***2026 අප්‍රේල් 21***

මූලාශ්‍රය: https://www.mea.gov.in/press-releases.htm?dtl/41063